**<u>රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ 2 සේවා ගණය අයත් අලෙවි සහකාර ( දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා බඳවා ගැනීම.</u>**

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අලෙවි සහකාර (දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා අංක 02 හි සඳහන් සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු 02 ක් පිරවීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. බඳවා ගැනීමේ ක්‍රමය

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරන ලද ආයතනයක් මගින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේ ප්‍රතිඵල මත දක්වන කුසලතා අනුපිළිවෙළ මත බඳවා ගනු ලැබේ.

1.1. ලිඛිත විභාගය

| තනතුර | විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| අලෙවි සහකාර | බුද්ධි පරීක්ෂණය | 100 | 40 |
| | සාමාන්‍ය දැනීම | 100 | 40 |

02. අවශ්‍ය සුදුසුකම්

2.1. විවෘත බඳවා ගැනීම

2.2. බඳවා ගන්නා ශ්‍රේණිය : 111 ශ්‍රේණිය

2.3. අධ්‍යාපන සුදුසුකම්: සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය, සහ තවත් විෂයයන් දෙකකට සම්මාන

සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් 06කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය

සමත්ව තිබීම හා

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) හෝ

(සමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්වීම

2.4. කායික සුදුසුකම් :

දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු මනා කායික හා මානසික ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.



2.5. වෙනත් :

ශ්‍රී ලංකික පුරවැසියකු විය යුතුය.

විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය

තනතුරට අදාලව ගැසට් පත්‍රයේ/පුවත්පත් නිවේදනයේ සඳහන් සුදුසුකම් නියමිත දිනට සම්පූර්ණ තිබීම.

**03.** වයස :

3.1. අවම සීමාව : අවුරුදු 18

3.2. උපරිම සීමාව: අවුරුදු 30

**04.** තනතුරේ ස්වභාවය

මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු / වැන්දඹු පුරුෂ අනත්දරු , විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

05. වැටුප්

5.1.. වැටුප් කේත අංකය : **MN 1 – 2016**

5.2. වැටුප් පරිමාණය : රු. 27,140 - 10 x 300 – **11 x 350 – 10 x** 495 – **10 x** 660 – 45,540/-

**06.** පත්වීම එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත්ය. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අලෙවි සහකාර තනතුරේ **III** වන ශ්‍රේණියට බඳවා ගෙන වසර **03**ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියෙහි සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

07. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක **07/2007** ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

08. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග වලටද මෙම පත්වීම යටත් වේ.

09. අයදුම්පත් ඉදිරිපත් කිරීම

i අයදුම්පත් **2017.04.03** දිනට හෝ එදිනට ප්‍රථම රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, නො. **163** , කිරුළපන මාවත , කොළඹ **05** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කල යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.



**ii.** ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් **A4** ප්‍රමාණයේ කඩදාසියක සකස් කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

**iii.** අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අලෙවි සහකාර (දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

**iv.** මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

**10.** සාවද්‍ය තොරතුරු සැපයීම

ඔබ විසින් එවන ලද අයදුම් පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

11. මෙම නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි වන්නේය. එමෙන්ම පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම හෝ පුරප්පාඩු වලින් කොටසක් පිරවීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

12. මෙම නිවේදනයේ සිංහල , දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල

භාෂා පාඨය බලපැවැත්වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි ,

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද

2017 පෙබරවාරි මස 06 වැනි දින , රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
අංක 163, කිරුළපන මාවත,
කොළඹ 05.

ආදර්ශ අයදුම් පත්‍රය

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා යි.)

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණය අයත් අලෙවි සහකාර ( දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා බඳවා ගැනීම.**

1.0 මාධ්‍යය :

සිංහල - 1
දෙමළ - 2
ඉංග්‍රීසි - 3

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

2.0 පෞද්ගලික තොරතුරු :

2.1 මුල්'කුරු අගට යොදා මුලකුරු සමඟ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් : ____________

උදාහරණ : SILVA A. B.

2.2 සම්පූර්ණ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :______________

2.3 සම්පූර්ණ නම (සිංහලෙන් / දෙමළෙන්) :________________

2.4 පෞද්ගලික ලිපිනය(සිංහලෙන් / දෙමළෙන්) :________________

2.5 ස්ත්‍රී / පුරුෂ භාවය : පුරුෂ - 0    අදාළ අංකය කොටුව තුළ ලියන්න ☐

ස්ත්‍රී - 1

2.6 විවාහක / අවිවාහක බව : අවිවාහක - 1    අදාළ අංකය කොටුව තුළ ලියන්න ☐

විවාහක - 2

2.7 ජන වර්ගය : (සිංහල - 1, දෙමළ -2, ඉ. දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5)

අදාළ අංකය කොටුව තුළ ලියන්න ☐

2.8 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

2.9 උපන් දිනය : වර්ෂය : ☐☐☐☐   මාසය : ☐☐   දිනය : ☐☐

2.10 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස: අ ☐☐   ☐☐   ☐☐

2.11 දුරකථන අංකය (තිබේ නම්) : ☐☐☐☐☐☐☐☐☐☐

3.0 අධ්‍යාපන සුදුසුකම්: අ.පො.ස.(සා.පෙළ) වර්ෂය:    විභාග අංකය:

| විෂය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

අ.පො.ස.(උ.පෙළ) වර්ෂය:    විභාග අංකය:

| විෂය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

4.0 අයදුම්කරුගේ සහතිකය :

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

__________________________

අයදුම්කරුගේ අත්සන

දිනය : ______

5.0 අත්සන සහතික කිරීම:

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................................................................ මයා/මිය/මෙනවිය මං පෞද්ගලිකව දන්නා හඳුනන බවත් ......................................................... දින මා ඉදිරියේදි ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

...........................................................................

අත්සන සහතික කරන ලද

නිලධාරියාගේ අත්සන

නම:- ...........................................................

පදවි නාමය:- ......................................................

ලිපිනය:-.........................................................

දිනය:- ............................................

(අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරයෙකු හෝ රු. 22,935/- ක් හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරණ නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.)